4

# ශ්‍රී ලංකාවේ චිරන්තන දැනුම් හා තොරතුරු සමාජ සම්ප්‍රදාය*

ඩබ්.එම්.ඒ.කේ. විජේකෝන්


**සංක්ෂිප්තය**

සමාජ සම්ප්‍රදායයන් පැවතීම ඕනෑම ජන සමාජයක නෛසර්ගික ලක්ෂණයකි. දැනුම හා තොරතුරු සම්ප්‍රදායික ජන උරුමයේ එක් සංරචකයකි. මූලික සමාජ අවශ්‍යතාවක් වන දැනුම සහ තොරතුරු ඓතිහාසික සමාජ ප්‍රගමනය තුළ සමාජ, ආර්ථික, සංස්කෘතික, ආගමික ආදි පරිසර තත්ව යටතේ ගතිකත්වයකින් යුතුව ප්‍රතිනිර්මිත වන්නකි. මෙම පසුබිමට අනුව අස්පර්ශනීය ජන උරුමයක් ලෙස, ශ්‍රී ලාංකේය සමාජ සන්දර්භය තුළ දැනුම සහ තොරතුරු උද්පාදනය, ප්‍රගමනය පිළිබඳ විශ්ලේෂණයක යෙදීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ. අස්පර්ශනීය සංස්කෘතිය උරුමයක් (Intangible cultural heritage) ලෙස ජන විඥානගත දැනුම හා තොරතුරු කාලීන සමාජ සංචලන අනුගතව වෙනස්වීම, යල්පැන යාම, නිශේධවීම හා යාවත් කාලීන වීම අනිවාර්ය ලක්ෂණයකි. අතීත ජන උරුම රැක ගැනීම හා අනාගත පරපුර උදෙසා සංරක්ෂණය කාලීන සමාජ අවශ්‍යතාවකි. ශ්‍රී ලංකාවේ චිරන්තන දැනුම් හා තොරතුරු සමාජ සම්ප්‍රදාය හඳුනා ගැනීම සහ විකාශනය පිළිබඳ ව පර්යේෂණාත්මකව අධ්‍යයනය අතීත ජන උරුම කළමනාකරණයෙහි ලා මාර්ගෝපදේශයක් වනු ඇත.


ප්‍රමුඛ පද : **ශ්‍රී ලංකාව, තොරතුරු, ජන උරුම, උරුම කළමනාකරණය, පුස්තකාල, තොරතුරු විද්‍යාව**

* Please cite this article as: විජේකෝන්, ඩබ්.එම්.ඒ.කේ. (2020), ශ්‍රී ලංකාවේ චිරන්තන දැනුම් හා තොරතුරු සමාජ සම්ප්‍රදාය, *The Journal of Archaeology and Heritage Studies*, Vol. 5 Issue II, Chief Editor : C.B. Ambanwala, Rajarata University of Sri Lanka, Mihintale. pp 45-61

**හැඳින්වීම**

ඕනෑම ජන සමාජයක ජනජීවිතය හා බද්ධ වූ සමාජ සම්ප්‍රදායයන් වේ. "අතීත ජන සමාජය විසින් පුද්ගලයාගෙන් පුද්ගලයාට, පරපුරින්පරපුරට උරුම කරදුන් අතීත අත්දැකීම්, අදහස්උදහස්, සිරිත්විරිත්, ආදියේ හරය වශයෙන් සම්ප්‍රදාය වැදගත් වේ. එනම් සම්මත චාරිත්‍රය සම්ප්‍රදාය වේ" (සෝරත හිමි 1970). මේ අනුව වර්තමානය හා අත්‍යන්තයෙන් බැඳුනු අතීතය සම්ප්‍රදාය වේ. සම්ප්‍රදාය තුළ දැනුම හා තොරතුරු සම්ප්‍රදායික ජන උරුමයේ එක් ඓතිහාසික පැතිකඩකි. දැනුම හා තොරතුරු මූලික සමාජ අවශ්‍යතාවකි. දැනුම හා තොරතුරුවලින් තොරව සමාජයකට පැවතිය නොහැකි ය. මූලික සමාජ අවශ්‍යතාවක් ලෙස දැනුම (Knowledge) බිහිවනුයේ තොරතුරු (Information) භාවිතයෙනි. තොරතුරු බිහිවනුයේ දත්ත (data) භාවිතයෙනි. ඒ අනුව, දත්ත එකතුවක් ලෙස තොරතුරුත්, තොරතුරු එකතුවක් ලෙස භාවියෙන් දැනුමක් බිහි වේ. දැනුම හෙවත් තොරතුරු පුද්ගලයාගෙන් පුද්ගලයාට, ජනසමාජයට, යුගයට සාපේක්ෂව බිහිවීම එහි විශේෂ ලක්ෂණයකි. දැනුම හා තොරතුරු ගතික ස්වභාවයෙන් යුක්ත වේ. එය නිරන්තරව වෙනස් වේ. නවීකරණය වේ. යාවත් කාලීන වේ. නිරන්තරයෙන් යල්පැන යාමත්, නිශේධවීමත් සිදු වේ. මෙය දැනුම් හා තොරතුරු සමාජයේ ස්වාභාවික පදනමයි.

පොදුවේ ගත්විට දැනුම හා තොරතුරු විශ්ව දැනුම (Universal Knowledge) ලෙස සංකල්පිත ය. තොරතුරු හා දැනුම ඊට පාදක සමාජ, ආර්ථික, සංස්කෘතික, ආගමික පසුබිම අනුව ස්වභාවයෙන්, විවිධත්වයෙන් යුක්ත වේ. පුද්ගලාන්තර, විෂයාන්තර, සමයාන්තර, ස්ථානීය යනාදි ලෙස සංකල්පිතව හා වාස්තවික අර්ථයෙන් වෙනස් වේ. ප්‍රදේශිය, කලාපීය, රාජ්‍යමය, ලෝකමය හා විශ්වමය වශයෙන් භෞතික සීමා පාදක වේ. භෞතිකත්වයෙන් වියුක්ත අස්පර්ශනීය සංස්කෘතික ජන උරුමයක් (Intangible cultural heritage) ලෙස සමාජ භාවිතයේ පවතී.

ශ්‍රී ලාංකේය සමාජ සන්දර්භය තුළ ද විවිධ අනන්‍යතා, අන්‍යෝන්‍ය සම්බන්ධතා පාදකව තොරතුරු හා දැනුම ප්‍රතිනිර්මාණය වෙමින් සමාජ භාවිතයේ පවතී. කාලානුරූපව සමාජ, ආර්ථික, දේශපාලනික තත්ව, සමාජ සංචලන, නව තාක්ෂණික විභවතා අනුව යම් යම් විපරිනාමයන්ට ලක් වෙමින් පවතී. අද වන විට දැනුම හා තොරතුරු නිෂ්පාදනය, පරිභෝජනය සීඝ්‍රයෙන් වැඩිවෙමින් පවතී. නව දැනුම නිෂ්පාදනය, සන්නිවේදනය, පරිවහනය (distribution) ගවේෂණය (Searching and Finding), සමුද්ධරණය (retrieval) පිළිබඳ ක්‍රමවේද සැකසෙමින් පවතී. දැනුම හා තොරතුරු කළමනාකරණය සමාජ ජීවිතයේ මූලික සංරචකයක් බවට පත් වෙමින් පවතී. සමස්ත ලෝකය ප්‍රාදේශීය, කලාපීය, රාජ්‍යමය වශයෙන් වූ සීමා අතික්‍රමණය කරමින් විශ්ව තොරතුරු ජාලයකට අවතීර්ණ වෙමින් පවතී. මාර්ෂල් මැක්ලුන්ගේ

**විශ්ව ගම්මානය** (universal village), ආතර් සි. ක්ලාර්ක්ගේ **විශ්ව පවුල** (universal family), ඇල්ප්‍රඩ් ටොප්ලර්ගේ **විද්‍යුත් කුටීර** (Electronic cottage) (වීරසිංහ 2002) වැනි සංකල්ප යථාර්තවත් වෙමින් පවතී.

මෙම පසුබිම මත තොරතුරු හා දැනුම අධිවේගී සුපිරි මාවත (Information super highway) හරහා සීඝ්‍රයෙන් සමාජාවතීර්ණ වෙමින් පවතී. තොරතුරු විද්‍යාඥයින් විසින් දැනුමේ ස්ටොපනයක් (knowledge explosion) ලෙස හඳුන්වන මෙම තත්වය තුළ තොරතුරු හා දැනුම බිහිවීමේ වේගයට සාපේක්ෂව නව දැනුම් මාධ්‍ය බිහිවෙමින් පවතී. මෙම නව දැනුම හා තොරතුරු ගලා ඒමේ වේගයට සාපේක්ෂව සම්ප්‍රදායික දැනුම හා තොරතුරු අවතැන්වීම සහ විනාශ වී යාම මුඛ්‍ය සමාජ ගැටලුවක් බවට පත් වෙමින් තිබේ. පාරම්පරික දැනුම හා තොරතුරු අනාගත පරපුර උදෙසා පවත්වාගෙන යාම සහ සංරක්ෂණය මූලික සමාජ අවශ්‍යතාවක් බවට පත් වෙමින් පවතී. හේතුව වත්මන් සමාජ සංවර්ධනයේ පදනම ගොඩනැගී ඇත්තේ අතීත උරුම සම්ප්‍රදාය මත වීමයි.

ශ්‍රී ලාංකේය ජන උරුම සම්ප්‍රදාය තුළ ද තොරතුරු හා දැනුම පාරම්පරිකව වෙනස්කම්වලට භාජනය වෙමින් පවතී. මෙම දැනුම හා තොරතුරු අස්පර්ශනීය සංස්කෘතික ජන උරුමයක් (Intrangible cultural heritage) ලෙස ජන විඥානගත ය. මෙම ජන උරුමය දේශිය සංස්කෘතික මුලාංග හා බැදෙමින් සාමුහික සමාජ සන්දර්භය තුළ ප්‍රතිනිර්මානය වෙමින් පරම්පරානුගතව පැවත ඒම ආශ්‍රිතව එහි ඇතැම් මුලයන් දේශීය ජනසමාජ පදනමින් ගිලිහී යාමේ අවදානමක් පවතී. අතීත උරුමය රැක ගැනීම හා අනාගත පරපුර උදෙසා සංරක්ෂණය ලෝක අවධානය යොමු වූ කාලීන විෂයයකි. ලෝක උරුම රැක ගැනීම යුනෙස්කෝ සංවිධානයේ ද ප්‍රමුඛ අරමුණකි. අස්පර්ශනීය ලෝක උරුම හඳුනාගැනීම, ලේඛනගත කිරීම, සංරක්ෂණය යුනෙස්කොව හා සම්මුතිගත රටවල වගකීමකි. මේ අනුව අස්පර්ශනීය ජන සංස්කෘතික උරුමයක් ලෙස ශ්‍රී ලංකාවේ ඉපැරණි දැනුම හා තොරතුරු සම්ප්‍රදාය හඳුනා ගැනීම, එහි ප්‍රගමනය විශ්ලේෂණය අනාගත පරපුර උදෙසා එය සංරක්ෂණය කර ගැනීමෙහිලා මූලාරම්භයක් වනු ඇත.

**තොරතුරු හා දැනුම් සමාජ සම්ප්‍රදාය : සංකල්පීය පසුබිම**

තොරතුරු හා දැනුම මානව ජීවිතය හා බද්ධ වූ විශේෂ අංගයකි. සමාජයක් තුළ යම් දෙයක් අවිච්ජින්නව සජීවීව පැවත ඒම තුළ එය සම්ප්‍රදායක් බවට පත් වේ. තොරතුරු හා දැනුම ඓතිහාසික සමාජ ප්‍රගමනය තුළ, අඛණ්ඩව ප්‍රතිනිර්මානය වෙමින් පැවත එයි.

දැනුම් හා තොරතුරු සමාජයේ මූලික පදනම වනුයේ දත්ත ය (data). දත්ත යනු යම් ක්ෂේත්‍රයක් තුළ කිසියම් ප්‍රස්තුතයක් සම්බන්ධව රැස්කරගත් පසු තීරණ ගැනීමේ කාර්ය සඳහා යොදා ගත හැකි ලෙස අර්ථාන්විතව ඉදිරිපත් කරනු නොලැබූ කරුණු (Raw Facts) සමුදායකි (උදයංග 2006). දත්ත යනු අංක, වගු, ප්‍රමාණ මිත උපදෙස් හෝ යම් දෙයක් සම්බන්ධව විස්තර කිරීමක් පිළිබඳ කරුණු එකතුවක් ලෙස හඳුනා ගත හැකි ය. දත්ත දෙයාකාරයකි.

1. ප්‍රමාණාත්මක දත්ත (Quantitative data)
2. ගුණාත්මක දත්ත (Qualitative data)

ප්‍රමාණාත්මක දත්ත යනු සංඛ්‍යාත්මක තොරතුරකි. අංකමය තොරතුරකි. ගුණාත්මක දත්ත යනු, යම් දෙයක් ගැන සවිස්තරාත්මක තොරතුරකි. යම් විස්තර කිරීමකි (http:www.mathsisfun.Com/data/data.html). මේ අනුව දත්ත යනු යම් ප්‍රතිසැකසීමක් නොකළ විශ්ලේෂණයක් නොකළ කරුණක්, හැඩයක්, රූපයක් අංකයක් වේ. තොරතුරු යනු, දත්ත එකතුවකි. එය උපයෝජකයාට තේරුම් ගත හැකි පරිදි අර්ථකථනය කරනු ලැබුවකි. මේ අනුව තොරතුරු යනු, තීරණ ගැනීම සඳහා යෝග්‍ය ලෙස අර්ථාන්විතව සකස් කරනු ලැබූ (processed data) දත්ත වේ.

දැනුම යනු තොරතුරු අත්දැකීම් සහ පුද්ගලයෙකුට හෝ සංවිධානයකට ප්‍රයෝජනයක් ගත හැකි සැඟවුන අරුතක් සහිත වූවකි. දත්ත එකතුවක් ලෙස පරිහරණයෙන් තොරතුරුත්, තොරතුරු එකතුවක් ලෙස භාවිතයෙන් දැනුමත් නිෂ්පන්න වේ. අතීත ජන සමාජ ආශ්‍රිතව තොරතුරු එකතුවක් ලෙස භාවිතයෙන් දැනුම සංකල්පයක් ලෙස සමාජ භාවිතයට පැමිණ ඇත. එය පාරම්පරික ජන සමාජය තුළ අඛණ්ඩව පැවත ඒම හා ප්‍රගමනය තුළ සමාජ සම්ප්‍රදායක් බවට පත්ව ඇත. එය නූතන දැනුමේ පදනම බවට පත්ව ඇත.

**ශ්‍රී ලාංකේය තොරතුරු හා දැනුම් සමාජ සම්ප්‍රදාය**

ඉපැරණි ශ්‍රී ලාංකේය තොරතුරු හා දැනුම් සමාජ සම්ප්‍රදාය එයටම ආවේනික ජන විඥාන පදනමක් මත උපත ලැබූවකි. එය දේශීය සමාජ, ආර්ථික, සංස්කෘතික ආගමික මූලයන් හා සුසංගතව එයට සාපේක්ෂව විකාශිත වූවකි. රටක සංස්කෘතිය එහි සමාජ සම්ප්‍රදාය ගොඩනැගීමේ දී මූලිකව වස්තු විෂය වන්නකි. ශ්‍රී ලාංකේය සංස්කෘතිය ආගමික මූලයන් මත ස්ථාපිත සංස්කෘතියක් ලෙස වැදගත් වේ. මෙලෙස බුදු සමය අනුගතව බෞද්ධ සංස්කෘතියක් අප රටේ නිර්මාණය වී ඇත. ශ්‍රී ලාංකේය තොරතුරු හා දැනුම් සමාජය බෞද්ධ සංස්කෘතික මූල හා අවියෝජනීව බැඳුණු අස්පර්ශනීය ජන සංස්කෘතික උරුමයක් ලෙස මෙරට ස්ථාපිතව ඇති බව ඓතිහාසික සාක්ෂි අනුව හඳුනාගත හැකි ය.

**බෞද්ධ තොරතුරු හා දැනුම් සමාජය**

ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය හා සම්බන්ධ පුරාවිද්‍යාත්මක අධ්‍යයන වලින් හෙළි වනුයේ අදින් වසර 27,000 පමණ පෙර සිට ලංකාව මානව ජනාවාසයක්ව පැවති බවයි. එසේම, ශත වර්ෂ 25කට අධික ලිඛිත ඉතිහාසයක සාක්ෂි වලින් ද හෙළි වනුයේ, ලෝක ශිෂ්ඨාචාර ඉතිහාසයේ විශේෂ ස්ථානයක් මෙරටට හිමිවන බවයි. මේ අනුව ක්‍රිස්තු පූර්ව 3 සියවසේ දී භාරතීය සමාජ දේශපාලනික සම්බන්ධතා අනුව බුදු දහම මෙරට ස්ථාපිත වීම එහි විශේෂ කඩඉමකි. මහින්දාගමනය සමඟ බුදු සමය මෙරට ජනගත වීම ආගමික චින්තනයේ විප්ලවකාරී වෙනසකට හේතු විය. මිහිඳු හිමි ගෙන ආ ධර්මය හෙළි බසින් ජන ගතකරවීම නිසා එය සීඝ්‍රයෙන් ප්‍රචලිත විය. බුදු දහමින් ලැබුන ශික්ෂණය මත පදනම් වෙමින් මෙරට ජනයාගේ චින්තනයේ සිදු වූ වෙනස්කම් නව සමාජ රටාවක් බිහිවීමට හේතු විය. බුදු දහම සමාජ ජීවිතයේ සමස්ත කටයුතුවලට බලපෑම නිසා ආගමික ශික්ෂණය පදනම් කරගත් සමාජ රටාවක් මෙරට බිහිවිය. බුදු දහම අනුව බෞද්ධ සංස්කෘතික පදනමක් මත සමාජය ගොඩ නැගුණි. "මෙම බෞද්ධ සංස්කෘතියේ විශේෂ ලක්ෂණයක් නම්, අභ්‍යන්තර හැඩ ගැස්වීමට මුල් තැන දීමයි. එය එහි පොදු ලක්ෂණය ලෙස සැළකිය හැකි ය. අනෙක නම් බුද්ධ දේශනාව එහි මාධ්‍ය කොට පැතිරී යාමයි. බුදුන්වහන්සේ මූලික කොට (ප්‍රභව කොට) ගලා යාමයි" (විමලවංශ හිමි 2000). මින් පැහැදිලි වනුයේ සමස්ත සමාජ ක්‍රියාවලිය බෞද්ධ චින්තනය අනුව මෙහෙයවුණු බවයි. බුදු දහම චින්තනය සඳහා දත්ත හා තොරතුරු සැපයෙන එකම මූලාශ්‍රය විය. මෙලෙස බුදු දහම හා බැඳුණු දත්ත හා තොරතුරු සමාජ තීරණ ගැනීමේ ක්‍රියාවලියට අර්ථාන්විතව සම්බන්ධ කරගැනීම තුළ, භක්ති මූල දැනුම් සම්ප්‍රදායකට ප්‍රවේශය විය. සමාජ ක්‍රියාවලියේ තීරක බලවේගය බුදු දහම වීම නිසා, ඉපැරණි ලාංකේය තොරතුරු හා දැනුම් සමාජය බෞද්ධ මුහුණුවරක් මත සමාජගතව ඇති බව පැහැදිලි ය. "අතීත සමාජයේ සෑම දෙයක්ම පාහේ නිශ්චිත වූයේ ආගම් අනුවයි. සමාජයේ පුද්ගලයා පාලනය කරන සාරධර්ම සියල්ලම පාහේ ආගමෙන් ලබා දෙන ලදී. සමාජ පාලනය, ආගමික වතාවත්, නිෂ්පාදනය, මිනිසා සම්බන්ධ පෞද්ගලික ක්‍රියාකාරකම් වෙන්වෙන්ව බෙදී නොතිබුණු අතර ඒ සියල්ලම ආගම තුළින් කළමනාකරණය විය. පැරණියෝ ආගමින් ඉදිරිපත් කරන අදහස් භක්තියෙන් පිළිගත්හ. ඒ අනුව සමාජ කළමනාකරණය පහසුවෙන් හා ගැටුම් විරහිතව සිදුකළ හැකි විය (පෙරේරා 2006).

මින් පැහැදිලි වනුයේ ලක්දිව අතීත සමාජ ක්‍රියාවලිය බුදු දහමේ ආභාෂය මත සිදු වූ බවත්, බෞද්ධ චින්තනය එම සමාජ ක්‍රියාකාරකම් හැඩ ගැස්වීමට බලපා ඇති බවයි. මේ අනුව බෞද්ධ චින්තනය මත සමාජ ක්‍රියාකාරකම් සිදුවීමත්, එයට සාපේක්ෂව තොරතුරු හා දැනුම නිෂ්පාදනය සහ පරිභෝජනය සිදුවීමත් තුළින් බෞද්ධ තොරතුරු හා දැනුම් සමාජයක් නිර්මාණයවීම තර්කානුගත සංසිද්ධියකි. මෙම තත්වය පරණවිතාන පැහැදිලි කරනුයේ මෙසේය. "භාරතයෙන් සිංහල

සංස්කෘතිය වැඩීමට අවශ්‍ය ආභාෂය ලැබිණි. එහෙත් භාරතයෙන් ආභාෂය ලද්දේ වී නමුත් සිංහල සංස්කෘතිය මෙම දිවයිනටම අනූනව වැඩිණි. පොදු වශයෙන් සළකන විට භාරතීය ජනයාගේ ජීවිත හින්දු ධර්මයට අනුව හැඩ ගැසී ඇත්තේ මෙන්ම, ලක් වැසියන්ගේ ජීවිත සකස් වී ඇත්තේ බුද්ධාගම ආශ්‍රයෙනි. ඈත අතීතයේ සිටම ආක්‍රමණ, සංක්‍රමණ ආදියේ ප්‍රතිඵලයක් ලෙස සිංහල රාජ සභාවේත්, පොදු ජනයාගේ ජීවිත වලත් බොහෝ හින්දු බලපෑම් ඇති වූ බවට සාධක ඇතත් ඒ කිසිවකින් මෙරට සමාජයේ පතුළටම කිඳා බැස තැන්පත්ව තිබුණ බෞද්ධ උරුව ඉවත් නොවී ය. මව් රටෙහි බුද්ධාගම බොහෝ දුරට නව මුහුණුවරකින් වෙනස් වූ අවධියක ලංකාවේ බුද්ධාගම මූලික ස්වරූපයෙන් වෙනස් නොවි පැවතිනි" (පරණවිතාන 1961).

ලක්දිව බුදු සසුන පිහිට වූ මිහිඳු හිමි කියා සිටියේ, මෙහි බුදු සසුන පිහිට වී යැයි කිව හැක්කේ ලංකා පුත්‍රයකු සසුනෙහි පැවිදිව විනය ප්‍රගුණ කොට විනය කර්ම කළ දාක බව විනය පිටකයට ලියන ලද අටුවාව වූ සමන්තපාසාදිකාවේ සඳහන් වේ. (සමන්තපාසාදිකා, හේවාවිතාරණ ග්‍රන්ථමාලා :60). මෙයින් පැහැදිලි වනුයේ භාරතීය ආභාෂය ලක්දිවට ලැබුන ද, දේශිය තොරතුරු හා දැනුම් සම්ප්‍රදාය බෞද්ධ මූලයන් මතම වර්ධනය වූ බවයි.

ක්ලාක්හෝන් උපුටා දක්වන පල්ලියගුරු පවසනුයේ "කිසියම් සමාජයක පවතින සංස්කෘතිය වූ කලි ජීවත්වීම සඳහා ඓතිහාසිකව සැළසුම් කළ නිර්මාණයක්" බවයි (පල්ලියගුරු 2003). වෙනත් බාහිර සමාජ සහ අපේ සමාජය තුළ ද පැවතියා වූ ජීවත්වීම සඳහා වූ සැළැස්ම ඓතිහාසික නිර්මානයකි. මෙයින් සනාථ වනුයේ ලාංකේය දැනුම් හා තොරතුරු සම්ප්‍රදායද ජීවත්වීම උදෙසා එදා පැවති බෞද්ධ සමාජ සංස්කෘතියට සාපේක්ෂව වැඩුනක් බවයි.

බුදු දහමේ මව්රට භාරතය වුව ද, මව්රටේ බුදු දහම පැවැත්ම සහ සමාජයේ කිඳා බැසීම පිළිබඳ බොහෝ බලපෑම් සිදුව ඇත. එහෙත් මව්රටෙන් බැහැරව ලංකාවේ බුදු දහම ස්ථාපිත වීම සහ සමාජ සංස්කෘතිය තුළ කිඳා බැසීම දැඩි හා තියුණු මුහුණුවරකින් සිදු වී ඇත. ලාංකේය පරිසරය තුළ බුදු දහම එහි මුලික ස්වරූපය වෙනස් වීමෙන් තොරව සමස්ත සමාජ ක්‍රියාවලිය හා අවියෝජනීයව බැඳී ඇත. මින් විශද වනුයේ බෞද්ධ තොරතුරු හා දැනුම මෙරට සමාජය ආශ්‍රිතව කරන ලද බලපෑමේ ප්‍රබලතාවයි. සම කාලීනව හින්දු ආගමින් මෙරට සමාජ ක්‍රියාවලියේ යම් වෙනසක් සිදු වූව ද බෞද්ධ ආගමික චින්තනයට ඉන් කිසිදු බලපෑමක් සිදු නොවුනි. ආදි කාලයේ පටන් ශ්‍රී ලංකාව ථෙරවාදි බෞද්ධ මූලස්ථානයක් ලෙස ප්‍රකට වීමෙන් එය කැපී පෙනේ.

බුදු දහම හැදෑරීමට එකළ විදේශීය යතිවරුන් රැසක් මෙරටට පැමිණ ඇත. බුද්ධඝෝෂ, බුද්ධදත්ත, ධම්මපාල ආදී බෞද්ධ යතිවරුන්ගේ ලංකාගමන තුළින් එය පැහැදිලි වේ. හියුංසාං නම් චීන සංචාරකයාගේ සටහන් වලින් ප්‍රකට වනුයේ, සිරිමේඝවර්ණ රජ සමයේ බුද්ධගයාවේ ඉදිකළ සිංහල විහාර ශ්‍රී විභූතියෙන් අනූනව පැවති බවයි (බුද්ධදත්ත හිමි). විජයබාහු රජුගේ ආරාධනය පරිදි මෙරට බුදු දහම නගාලීමට පැමිණියේ රාමඤ්ඤ දේශයට ගොස් සිටි භික්ෂූන් බවට මතයක් ඇත (ලියනගමගේ 1961). එසේම 13 සහ 15 සියවස්වල සියමේ හා කාම්භෝජයේ බෞද්ධයන් බෞද්ධ ධර්මයේ මූලස්ථානයක් ලෙස පිළිගෙන ඇත්තේ ලක්දිවයි. මෙයින් ප්‍රකට වනුයේ ද, බෞද්ධ තොරතුරු හා දැනුම් මධ්‍යස්ථානයක් ලෙස ලක්දිවට තිබූ වැදගත් බවයි.

බුදු දහම මෙරට පිහිටුවීමෙන් පසු සමාජ සංස්කෘතික පරිසරයේ ඇති වූ නවාංගවලින් පැහැදිලි කරනුයේ ද, බුදුදහම මෙරට තොරතුරු හා දැනුම් සමාජයේ පදනම වූ වගයි. උසස් ශිෂ්ටාචාරයකට අවැසි ශික්ෂණය බුදු දහමින් ලැබිණි. එය සන්නිවේදනයට අවශ්‍ය මාධ්‍ය පසුබිම හෙළ බසින් නොඅඩුව ලැබිණි. එතෙක් පැවති අසංවිධිත බහු ඇදහිළි ක්‍රමයට විකල්පව සහජීවනය සහ සමානාත්මතාව සහිත ආගමික දර්ශනයක් මෙරටට ලැබිණි. එය තත් කාලීන තොරතුරු හා දැනුම් සමාජය බෞද්ධ චින්තනයට ආශ්‍රිතව බිහිවීමට හේතුව විය. මිහිඳු හිමි දෙසූ ධර්මය මෙරට ජනයාගේ චින්තනය හා සමාජ ක්‍රියාකාරකම් වෙනස් කිරීමට බලපානු ලැබී ඇත. මහාවංශයේ සඳහන් පරිදි මිහිඳු හිමිගේ *විමානවත්තු* සහ *ප්‍රේතවත්තු* දේශනා මගින් සසර දිවියේ ආදිනව පෙන්වා දෙනු ලැබ ඇත. චතුරාර්ය සත්‍යයෙන් එහි ආදිනව තහවුරු කිරීමත්, *දේව දූත සූත්‍රය* මගින් හොඳ නරක පිං පව් අවබෝධ කරදීමත් සිදු වී ඇත. *ධම්මචක්ක පවත්වන සූත්‍රයෙන්* ආර්ය අෂ්ටාංගික මාර්ගය පැහැදිලි කරනු ලබ ඇත (මහාවංශය :පරි.14-15). මේ අනුව දේවවාදි චින්තනය යටපත්ව බෞද්ධ චින්තනය මෙරට මුල් බැස ගැනීම සිදුව ඇත.

බුදු දහම සංස්ථාපනය සමග භික්ෂු ශාසනය මෙරට පිහිටුවීම බෞද්ධ තොරතුරු හා දැනුම් සම්ප්‍රදාය වේගවත් වීමට බලපානු ලැබ ඇත. හොඳනරක, පිංපව්, සමාජ සාරධර්ම, ගිහි අධ්‍යාත්මික සංවර්ධනය මේ අනුව ප්‍රවර්ධනය වී ඇත. රාජ්‍ය පරිපාලනය, ජීවන ක්‍රමය සහ ජීවන පැවැත්ම, පරිභෝජනය නිෂ්පාදනය ආදි සමස්ත සමාජ ක්‍රියාකාරකම් බොදු පිළිවෙත අනුව සිදුව ඇත. බුදු සමය ජන ජීවිතයේ උරුමය බවටත්, ඒ අනුව බුදු දහම ජාතික ආගම බවටත් පත්ව ඇත. බෞද්ධ පැවිදි සමාජය ගිහි බෞද්ධ සමාජයේ පැවැත්ම තීරණය කෙරෙන තීරක බලවේගය වී ඇත. මේ අනුව සංඝ සමාජය ගිහි ජීවිතයේ මෙලොවපරලොව සමාජ චර්යා ධර්ම පිළිබඳ තොරතුරු කේන්ද්‍රය බවට පත්ව ඇත. මේ නිසාම ලෞකික ජීවිතයේ පැවැත්මට බර තැබෙන විද්‍යා, කලා, වානිජ විෂය ක්ෂේත්‍ර බිහිවීමට අවශ්‍ය පසුබිම සීමා කරලනු

ලැබ ඇත. ඒ තුළ බුද්ධි මූල දැනුම් හා තොරතුරු සමාජයකට ප්‍රවේශ අවස්ථා සීමා කෙරෙමින්, භක්ති මූල දැනුම් හා තොරතුරු සම්ප්‍රදායකට මඟ විවෘත වූ බව පැහැදිලිය.

සහජීවනය සහ සමානාත්මතාව පදනම් වූ ප්‍රතිපත්තිමය සමාජ ජීවිතයකට පොදු ජනයා දැනුවත් කිරීමත්, අමිස හා ප්‍රතිපත්ති පූජාවෙන් ඒ සඳහා යොමු කරලීමත් එකළ දැනුම් හා තොරතුරු සමාජයේ මූලික කාර්යභාරය විය. භික්ෂු සංඝයා උදෙසා ලෙන් ආරාම පූජා කිරීමේ චාරිත්‍රයෙන් පැහැදිලි වනුයේ, එම ගුණාංගයයි. *අගත අනගත ශගශ දිනේ* යන පාඨයෙන් අර්ථවත් වනුයේ එයයි.

එකළ තොරතුරු හා දැනුම් සමාජයේ බෞද්ධ බලපෑම රාජ්‍යත්වය විෂයේහි ලා රජවරුන්ගේ හා සාමාන්‍ය ජනයාගේ ආකල්ප හා චින්තනය මඟින් ද පැහැදිලි වේ. රාජ්‍ය පාලනය තුළ බුදු සසුනට ප්‍රමුඛස්ථානය ලබා දීම, අනුග්‍රහය හා කැපවීම ප්‍රමුඛ කාර්යයක් විය. දුටුගැමුණු රජුගේ ප්‍රකාශයක් වන "මගේ මෙ ව්‍යායාමය හුදෙක් රජ සැප සඳහා නොවන්නේය. සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහාම වන්නේය" යන්නෙන් පැහැදිලි වන්නේ බුදු සමය සමාජ චින්තාව සඳහා බලපා තිබූ ආකාරයයි. බුදු දහමේ ආරක්ෂාව සඳහා කටයුතු කිරීම, බුදුන්ගේ ධාතු පූජ්‍ය වස්තු සේ සැළකීම, දළදාව රාජ්‍යත්වයේහි ලා සැළකීම හා සුරකීම යන ඉපැරණි සංසිද්ධි වලින් පැහැදිලි වනුයේ බුදුදහමේ සාමාජීය බලපෑමයි.

ලක්දිව ඉපැරණි තොරතුරු හා දැනුම් සමාජය බුදු සමය කේන්ද්‍රියව බිහි වූ පරිදිම, කාලීනව බුදුදහමේ පිරිහීම්, වර්ධන, මතවාදීමය වෙනස්කම්වලට සාපේක්ෂව වැඩුනකි. ලක්දිව ප්‍රථම බෞද්ධ මධ්‍යස්ථානය දේවානම්පියතිස්ස රජු කර වූ මහා විහාරයයි. මෙය බෞද්ධ සභ්‍යත්වයේ, සංස්කෘතියේ, ථේරවාදි බුදු සමයේ මධ්‍යස්ථානය විය. වළගම්බා රජ කරවූ අභයගිරිය, ජේතවනය මහායාන බුදු දහමේ මධ්‍යස්ථාන විය. මහායාන බුදුසමය සමඟ ලෝකෝත්තර දැනුම් හා තොරතුරු සම්ප්‍රදායෙන් බැහැරව ජ්‍යෝතිෂ්‍යය, වෛද්‍ය විද්‍යාව, කාව්‍ය ශාස්ත්‍රය ආදි ලෞකික විෂය පාදක දැනුම් හා තොරතුරු සම්ප්‍රදායකට අවතීර්ණ වුව ද, එය බුදු දහමේ පරිධිය තුළම සිදුවීම විශේෂත්වයකි.

මහින්දාගමනයේ සිට බෞද්ධ චින්තනය පදනම් කර ගනිමින් පැවත ආ මෙරට බෞද්ධ තොරතුරු හා දැනුම් සම්ප්‍රදාය යුරෝපීයයන්ගේ ලංකාගමනය තෙක්ම වෙනස් නොවුන බව ඓතිහාසිකව පැහැදිලි කරණකි. මින් පැහැදිලි වනුයේ එකළ ලක්වැසියන්ගේ එකම සහ මූලික දැනුම් ප්‍රභවය බුදු දහම වූ බවයි. එය බුද්ධි මූල දැනුම් ප්‍රවේශයකට වඩා භක්ති මූල දැනුම් ප්‍රවේශයක් විය. එකළ පැවති ලෞකික විෂය ක්ෂේත්‍ර පවා බුදු දහමේ ප්‍රකාශන ලෙස සමාජ ගතව ඇත.

බුදුන් වහන්සේට සම කාලීනව ක්‍රිස්තු පූර්ව යුගයේ ජීවත් වූ විද්වතුන් ලෙස මහාවීර, කොන්පියුසියස් යන ශාස්ත්‍රවරු ද, සොක්‍රටීස්, ප්ලේටෝ, ඇරිස්ටෝටල් (අයිවන් 2017) යන පඬිවරුන් ද සැළකේ. පයිතගරස්, යුක්ලිඩ් ගණිතය, ආර්කිමිඩීස් ගණිතය හා ඉංජිනේරු විද්‍යාව, ඇරිස්ටෝටල් දේශපාලන විද්‍යාව වැනි විෂයයන්හි ප්‍රබුද්ධයන් වුව ද, එකළ ලක්දිව දැනුම් හා තොරතුරු සමාජයට ආගමික නොවන එවැනි කිසිම ප්‍රඥයෙකුගේ චින්තනය කිසිම අයුරකින් බලපා නැත. බුදු සමයට සමාන්තරව බලපානු ලැබ ඇත්තේ හින්දු ආගම පමණි. ඉන් ගම්‍ය වනුයේ ආගමික චින්තනය එකළ දැනුම් සමාජයේ තීරක බලවේගය වූ බවයි.

ලාංකේය දැනුම් හා තොරතුරු සමාජය ලෝක දැනුම උකහා ගැනීමෙන් තොරව ආගමික දැනුම් පරිධියටම සීමා වී පැවති බව, එකළ අධ්‍යාපනික විෂය නිර්දේශ වූ ආගම, භාෂාව, සාහිත්‍ය යන විෂය ක්ෂේත්‍ර වලින් පැහැදිලි වේ. තාරකා ශාස්ත්‍රය, වෛද්‍ය විද්‍යාව වැනි විෂය ක්ෂේත්‍ර භාවිතයට පැමිණිය ද ඒවා ද ආගමික පසුබිමක බිහි වූ වෛයිකල්පිත විෂය ක්ෂේත්‍රම විය.

මධ්‍යතන යුගය මිනිස් ශිෂ්ඨාචාරයේ දැනුම හා තොරතුරු ප්‍රගමනය පිළිබඳ විශේෂි අවධියකි. එය නූතන දැනුම් හා තොරතුරු සමාජයේ පාදක අවධිය විය. එකළ සිදු වූ ලෝක සමාජ සංචලන ලාංකේය ජන ජීවිතයට ගලා ඒමක් සිදු නොවුන බව සම කාලීන තොරතුරු හා දැනුම් සමාජය තුළ පැහැදිලි කරණකි. ලංකාව මැකියාවලි (1467-1642, කොපර්නිකස් (1437-1543, කෙප්ලර් (1571-1560) ගැලීලියෝ (1564-1642) ගැන හෝ ඔවුන් විද්‍යාත්මක තලයේ ඇති කර තිබූ වෙනස්කම් ගැන දැන නොසිටියෝ ය. ප්‍රැන්සිස් බේකන් (1561-1620), හොබ්ස් (1538-1679), ඩේකාට් (1596-1650), ස්පිනෝවා (1632-1677), ලොක් (1632-1704) රූසෝ (1712-1787), කාන්ට් (1712-1778) ගැන එකළ දැන නොසිටියෝ ය (අයිවන් 2017). මින් පැහැදිලි වනුයේ ද ලාංකේය තොරතුරු හා දැනුම් සමාජය සම කාලීන ලෝක තත්ව හා සන්සන්දනයේ දී අඛණ්ඩවම බොදු දහම කේන්ද්‍ර කර ගත් භක්ති මූල දැනුම් සම්ප්‍රදායක කිදා බැස තිබුන බවයි.

**බෞද්ධ ගුරුකුල අධ්‍යාපන සම්ප්‍රදාය**

ඉපැරණි ලාංකේය දැනුම් හා තොරතුරු සමාජ සම්ප්‍රදාය තුළ දැනුම හා තොරතුරු නිෂ්පාදනය, පරිභෝජනය, සන්නිවේදනය සිදු වී ඇත්තේ ගුරු කුල අධ්‍යාපනය ආශ්‍රිතව ය. එකල ආචාර්ය පරම්පරා අතර පැවති අධ්‍යාපන ක්‍රමවේදය ලෙස මෙය වැදගත් වේ. එය ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයකි. අධ්‍යාපන මධ්‍යස්ථානය විහාරස්ථානය විය. භික්ෂූන් ආචාර්යවරු විය. ශිෂ්‍ය ප්‍රජාව ද භික්ෂූන්ම විය. පුරාණයෙහි භික්ෂු සංඝයා අතර පැවති විශාලතම සංවිධානය වූයේ **නක** හෙවත්

නිකායයි. එවැනි සංවිධාන තුනක් ගැන සඳහන් වේ. තුන් නකය සම්බන්ධ වූ විහාර (වෙහෙර) තුනක් ද විය. ඉන් පළමුවැන්න **මහ මෙවුනා නකය** (මහ වෙහෙර) මහා විහාරය යන්නයි. දෙවැන්න **බගිරි නකය** (අභයගිරි වෙහෙර) අභයගිරි විහාරයයි. තෙවැන්න දෙනා **නකය** (දෙනා වෙහෙර, ජේතවන) විහාරයයි. මෙම එක් එක් නකයට නොහොත් විහාරයට අයත් **මුළ** ද විය. මහ මෙවුනා නකයට (මහා විහාරයට) යටත් පිරිසෙයින් එක් මුළක් විය. පසුව ගණන වැඩිවිය. බගිරි නකයට සතර මුළක් විය. දෙනා නකයට අයත් එක් මුළක් ගැන යයි කියවෙන්නේ මුළු යටතේ පැවතුණු අවාසයෝ ද විය. අධ්‍යාපනයේ මූලස්ථානය පැරණි මුළු වලින් පැවත ආ පිරිවෙනයි. එක් එක් මුළට සම්බන්ධ වූ පිරිවෙන් රැසක් රටපුරා පිහිටියේ ය. එහි අධ්‍යාපනය ලැබුවෝ ගිහිපැවිදි දෙ පක්ෂයටම අයත් වූවෝ ය (කුලසූරිය 1999).

ඉපැරණි ලාංකේය දැනුම් හා තොරතුරු සමාජයට ප්‍රවේශය සැපයූ පැරණි අධ්‍යාපන ක්‍රමවේදය **භාණක ක්‍රමය** හෙවත් කට පාඩමින් පවත්වා ගෙනයාම මත සිදු වී ඇත. නිරන්තර අභ්‍යාසය මත ස්මරණය සිදුවිය. පහසුව සඳහා ධර්මය කොටස් වශයෙන් ඉගෙනීමත්, ආරක්ෂා කර ගැනීමත් සිදුවිය. මේ නිසා **භාණක තෙරවරු** නමින් භික්ෂු කොටසක් ද බිහිවිය. මෙම භාණක අධ්‍යාපන ක්‍රමය ගුරුකුල හා නිකාය අනුව ද, භික්ෂු පැවැත්මේ ග්‍රන්ථධූර, විදර්ශනා ධූර පිළිවෙත් අනුව ග්‍රාමවාසී හා අරණ්‍යවාසී යනුවෙන් ද වෙනස්කම් වලට ලක්ව ඇත (මහාවංශය :33-34 පරි.). පසු කාලීනව පිරිවෙන් අධ්‍යාපනයත්, මූලායතන අධ්‍යාපනයක් (ම.ව.: 39 පරි. 59 ගාථාව) ආරම්භ වී ඇත.

පුරාතන ලාංකේය අධ්‍යාපනයට පදනම් වූ දැනුම හා තොරතුරු විෂය කේන්ද්‍රීය විය. විෂය මාලාව ආගමික විය. සජ්ඣායනය, දේශනා ක්‍රමය, පෞද්ගලික ඉගැන්වීම් ක්‍රමය අධ්‍යාපන ක්‍රමවේද විය. ශ්‍රවණය හා ධාරණය අධ්‍යාපනය පවත්වාගෙන යාමේ ක්‍රමවේද විය. වනපොත් කිරීම සිදු විය. *සුනාථ, ධාරේථ, චරථ* (අසව්, දරව්, හැසිරෙව්) යනු එකළ අධ්‍යාපනයේ මුඛ්‍ය පාඨය විය. ධර්මය ඉගෙනීම භික්ෂූත්වයේ ප්‍රධාන අංගය විය. මහණ වීමේ දී දෙ දෙනෙකු තමාගේ ගුරුවරු ලෙස පත් කරගන්නා ලදී. ආචාර්ය හා උපාධ්‍යාය ලෙස ආචාර්යවරයා අධ්‍යාපනය ද, උපාධ්‍යාය ගෝලයාගේ විනය ද සොයා බැලීය (ජයවීර 1996).

ආදි කාලීන ලාංකේය අධ්‍යාපනය ආගමික දැනුම හා තොරතුරු පෙරටු කර ගත්තක් විය. පුද්ගල හා සමාජ සංවර්ධනය අධ්‍යාපන අරමුණු විය. මෙලොව හා පරලොව අධ්‍යාපනයේ ඉලක්ක විය. ඒ අනුව දෛනික ජීවිතය ආගම හා බැඳුනි. ආගම සිහිකිරීම සෑම සමාජ කාර්යයක් සමඟම බැදී ඇත. මින් පැහැදිලි වනුයේ පැරණි ලාංකේය අධ්‍යාපනය ලාංකේය තොරතුරු සහ දැනුම් සමාජය විෂයේහි ලා පැවති වාස්තවික බැඳියාවයි.

ඉපැරණි ලක්දිව දැනුම් හා තොරතුරු සමාජයට පසුබිම් වූ බෞද්ධ අධ්‍යාපනයේ විශිෂ්ටතම අවධිය ලෙස කෝට්ටේ යුගය වැදගත් වේ. මෙම යුගය වන විට කැරගල පද්මාවති, තොටගමුවේ විජයබා, වීදාගම ඝනානන්ද, දෙව්නුවර තිලක, පැපිලියානේ සුනේත්‍රාදේවී වශයෙන් පැවති පිරිවෙන් හා ඒවායේ ඉගැන්වුණු විෂය නිර්දේශ වලින් පැහදිලි වනුයේ ද, ආගමික අධ්‍යාපනය ඒවන විට ද මූලිකව පැවති බවයි. භාෂා, සාහිත්‍ය විෂය ක්ෂේත්‍රවල දියුණුවක් සිදුවුන ද, ආගමික පසුබිමින් මිදුණු බවට සාධක දක්නට නැත. සංදේශ සාහිත්‍ය මගින් හෙළිවන තොරතුරු අනුව විජයබා පිරිවෙන කේන්ද්‍රගතව ග්‍රාමවාසි ගුරුකුලයත්, කැරගල පද්මාවති පිරිවෙන ආශ්‍රිතව වනවාසි ගුරුකුලයත් ගොඩනැඟි ඇත. ථෙරවාදී බුදු දහම පදනම වූ මෙම අධ්‍යාපන ආයතනවල වෙනස වූයේ ආගමික වත් පිළිවෙත්වල පමණි. මෙම අරණ්‍යවාසි හා වනවාසි ගුරුකුල පිළිබඳව එකළ සංදේශ සාහිත්‍ය තුළින් හෙළිවන අධ්‍යාපන පසුබිම, තරඟකාරිත්වය, අධ්‍යාපන පරතරය, පිළිබඳ තොරතුරු වලින් පෙනී යනුයේ ආගමික දැනුම් පරිසරයේ අඛණ්ඩ වර්ධනයයි. මෙයින් පැරණි ලාංකේය අධ්‍යාපන සම්ප්‍රදාය ශාස්ත්‍රීය දැනුමට වඩා සිල්වත්භාවය සහ සදාචාරය පදනම් කොට ගත් දැනුම් හා තොරතුරු ප්‍රවාහයකට නතුව පැවති බව හෙළි වේ.

15 සියවස වන විටත් බෞද්ධ අධ්‍යාපන ක්‍රමවේදය ලංකාව තුළ අඛණ්ඩව සමාජගතව පැවති බව, සම කාලීන ලෝක අධ්‍යාපන ඉතිහාසය හා සසඳන විට ප්‍රකට වේ. බෞද්ධ අධ්‍යාපනයේ ස්වර්ණමය අවධිය ලෙස සම්භාවිත කෝට්ටේ යුගය (ක්‍රි.ව. 1410-1277) තුළ පැවති අධ්‍යාපනය බෞද්ධ ලකුණ තුළ ක්‍රියාත්මක පරිසරයක ඊට සම කාලීන බටහිර ලෝකයේ (ක්‍රි.ව. 1000-1200) අධ්‍යාපනය ආගමික පසුබිමින් මිදුණු දැනුම් පාදක පසුබිමක පැවති බවට ඓතිහාසික සාධක වේ. බටහිර ලෝකයේ ආගමික පසුබිමින් මිදුණු විශ්වවිද්‍යාල බිහිවීම ඇරඹී ඇත. නිදසුනක් ලෙස පැරිස් හා ඔක්ස්පර්ඩ් විශ්වවිද්‍යාල වල දේවධර්මය සමඟ ලතින් ව්‍යාකරණය, තර්ක ශාස්ත්‍රය, අලංකාර ශාස්ත්‍රය, ගණිතය, ජ්‍යාමිතිය ආදි විෂය ඉගැන්විනි. ඉතාලියේ **බෙලොන්නා** විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යාව ඉගැන්විණි (බස්නායක 2003). මෙකළ ඇරිස්ටෝටල්, ප්ලේටෝ ආදින්ගේ දාර්ශනික මතවාද සමාජගත වෙමින් පැවතිනි. මධ්‍යතන යුගයේ ඉතාලිය මූලික කර ගනිමින් ඇරඹි පුනරුද ව්‍යාපාරය, මානව වාදය, ආගමික ප්‍රතිසංස්කරණ, අත්හදා බැලීම් හා නව සොයා ගැනීම් අධ්‍යාපනයේ නව ප්‍රවනතා රැසකට හේතු විය. භෞතික ලෝකය පිළිබඳ කරන ලද අධ්‍යාපන හා ගවේෂණ නව විද්‍යාත්මක චින්තනයකට පසුබිම් විය. නිකලෝ මැකියාවලි (1467-1527), කෙප්ලර් (1571-1630), කොපර්නිකස් (1473-1543), විලියම් හාර්වේ (1543) රෙනේ ඩේකාර්ට් (1596-1650), ප්‍රාන්සිස් බේකන් (1561-1620), නිව්ටන් (1687) ආදින් මධ්‍ය කාලීන යුගයේ විද්‍යාත්මක චින්තකයන් ලෙස විශේෂ විය. මීට සම කාලීනව ලක්දිව විසූ චින්තකයන් වූයේ තොටගමුවේ ශ්‍රී රාහුල හිමි, වැත්තෑවේ හිමි, වීදාගම හිමි ආදි

පැවිදි පඬිවරයෝ ය. මෙයින් හෙළි වනුයේ ලංකාවේ එකළ පැවති ආගමික මූල තොරතුරු හා දැනුම් සම්ප්‍රදායයි. යුරෝපීයයන් මෙරටට පැමිණ පාසල් අධ්‍යාපනය අරඹන තුරුම ලක්දිව අධ්‍යාපනයේ වෙනසක් නොවීම තුළින් පැහැදිලි වනුයේ, ඉපැරණි ලාංකේය දැනුම් හා තොරතුරු සමාජයේ පෝෂණයට ඉපැරණි බෞද්ධ අධ්‍යාපන ක්‍රමවේදය නොමද පිටිවහලක් වූ බවයි.

**බෞද්ධ ප්‍රලේඛන සම්ප්‍රදාය**

පුරාතන ලාංකේය දැනුම් හා තොරතුරු සම්ප්‍රදාය තුළ තොරතුරු සහ දැනුමේ ලිඛිත ප්‍රකාශන ලෙස ඉපැරණි ප්‍රලේඛන සාහිත්‍ය වැදගත් වේ. මෙම ඉපැරණි ලේඛන බෞද්ධ ප්‍රවේශයක් තුළ බිහිව ඇති බව ප්‍රකට කරුණකි. බෞද්ධ සංස්කෘතික පසුබිමක ආගමික චින්තනය මුල් බැස ගැනීම ආගමික ප්‍රලේඛන සාහිත්‍යයක් බිහිවීමට හේතු සාධකව ඇත.

බුදු සමය මෙරට සමාජගත වීම සමඟ ධර්මය මුඛ පරම්පරාගතව පවත්වාගෙන යාම සිදුවිය. මෙම මුඛ පරම්පරාගත ධර්මය ආරක්ෂා කර ගැනීමේ අවශ්‍යතාව ප්‍රලේඛන බිහිවීමේ සමාරම්භය විය. එකළ පැවති තොරතුරු හා දැනුම් සමාජ සම්ප්‍රදායට සාපේක්ෂව බිහි වූ සියලු ලේඛන ආගමික ග්‍රන්ථ වලට සීමාවුණි. භික්ෂූන් සමාජයේ දැන උගත් පුද්ගලයන් ලෙස සම්භාවනාවට ලක් වීම නිසා ප්‍රලේඛනය ඔවුන්ගේ පරම අයිතියක් විය. ත්‍රිපිටකයට ලියූ අටුවා, ටීකා, ප්‍රකරණ වශයෙන් නාමික එම ග්‍රන්ථ ආගමික ප්‍රලේඛන විය. භික්ෂූන් විසින් භික්ෂූන් සඳහාම ලියූ එම ග්‍රන්ථ සාමාන්‍ය ජනයා සඳහා නොවුණි. ආගමික පසුබිම තුළ ග්‍රන්ථකරණය සිදුවීම නිසා ඒවා ශෘංගාරාදි රසයෙන් තොර දළ දඬු පොත්පත් විය. වින්දනය සඳහා නොවුණි. සාමාන්‍ය ජනතාව තුළින් නිර්මාන පැනනැඟුන ද ඒවායේ පැවැත්මට අවැසි පසුබිමක් එකළ නොවන්නට ඇත. ශාංගාරාදි ගද්‍ය පද්‍ය සහ ලෞකික විෂය සඳහා ආගමික පසුබිම තුළ අවස්ථා නොතිබිණි. භික්ෂු මූලික සමාජය තුළ පොදු ජනයා සඳහා ලේඛන ව්‍යවහාරයක් නොවුණි. හීනයානය අභිබවමින් මහායානය ඉස්මතුවන තෙක්ම පොදුජන සාහිත්‍යයක් සඳහා යම් තරමක හෝ ඉඩ හසර වෙන් වීමක් සිදු නොවීය. ආගමික න්‍යායය පත්‍රයක් මත සියල්ල පාලනය වුණි.

විෂයයීය වශයෙන් විවිධ විෂය මත ලේඛන සම්පාදනයක් සිදු නොවුණි. බුදු සමය සහ වංශ කථා සාහිත්‍ය සඳහා පුළුල් ඉඩකඩක් විවෘත විය. බුදු සමයේම කොටසක් ලෙස වංශ කතා ලියවිණි. ලංකා ඉතිහාසයත් බුදු සමයේ ඉතිහාසයත් එකක්ම වීමෙන් මෙය පැහැදිලිය. ආගමික ග්‍රන්ථ වලට අමතරව මහාවංශ, දීපවංශ, ථූපවංශ, දෘඨාවංශ, බෝධිවංශ ආදි වශයෙන් ඓතිහාසික ග්‍රන්ථ එකළ ප්‍රලේඛන සාහිත්‍යයට එකතු වී ඇත.

මෙම පසුබිමට සාපේක්ෂව අපරදිග ලෝකයේ ලේඛන කලාව ආගමික මූල දැනුම් හා තොරතුරු සම්ප්‍රදායෙන් වියුක්තව බුද්ධි මූල තොරතුරු හා දැනුම් සමාජ පදනමකට ප්‍රවර්ධනය වී ඇති බවට සාධක වේ. අපරදිග ලෝකයේ තොරතුරු හා දැනුම් සම්ප්‍රදාය ආගමික නොවන අධ්‍යාපනය සහ ප්‍රලේඛන ව්‍යවහාරය ආශ්‍රිතව වෙනත් මඟක් ගෙන ඇත. නිදසුනක් ලෙස ක්‍රිස්තු පූර්ව 428 ප්ලේටෝගේ අධ්‍යාපන අරමුණ වී ඇත්තේ 'පරමාදර්ශී රාජ්‍යයකට රාජ්‍ය ආරක්ෂකයන් තැනීමයි'. ඔහුගේ Republic කෘතියේ සඳහන් වනුයේ 'රටක සමාජ සංවර්ධනය රඳන්නේ එහි ස්ථාවරත්වය උඩයි. රාජ්‍යයේ සිටින නොයෙකුත් මිනිසුන්ගේ අවශ්‍යතා සහ හැකියා අනුව අධ්‍යාපන තත්වය සකස් විය යුතුයි' යනුවෙනි. ඔහු 'අධ්‍යාපනය ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයට පොදු විය යුතු' බව අදහස් කළේ ය.

මීට අමතරව ක්‍රිස්තු පූර්ව 1712-78 යුගයේ විසූ ජීන් ජැක් රූසෝ ගේ මතය වූයේ 'ස්වභාව ධර්මයෙන් එන සෑමදෙයක් ම හොඳය. ඒ නිසා අධ්‍යාපනය ස්වභාව ධර්මයට අනුව සිදුවිය යුතු ය. මෙය කෘතිමත්වයෙන් තොරවිය යුතුය' යනුවෙනි. මේ අනුව බටහිර තොරතුරු හා දැනුම් සමාජයට ප්‍රවේශය සැළසූ බටහිර අධ්‍යාපනය සහ ප්‍රලේඛන මාධ්‍ය ආගමික මුහුණුවරින් මිදී ඇත.

ලාංකේය පුරාතන ලේඛන සම්ප්‍රදාය තුළ, ලේඛන පරිවර්තනය ඓතිහාසික කාර්ය භාරයකි. මේ අනුව ක්‍රිස්තු පූර්ව 5 ශත වර්ෂයේ මෙරට පැමිණි බුද්ධඝෝෂ හිමි බුදු දහම පිළිබඳ වූ හෙළ අටුවා පාළියට පරිවර්තනය කරනු ලැබ ඇත. (මහාවංශය :243-244) මීට අමතරව ධම්මපාල, බුද්ධදත්ත ආදි අටුවාචාරීන් ද පාළි අටුවාකරණයේ යෙදී ඇත. මෙයින් පැහැදිලි වනුයේ, ලේඛන පරිවර්තනය සිදු වුව ද බුදු දහමින් පරිබාහිරව එය කිසිදු අයුරකින් සිදු නොවූ බවයි. බාහිරෙන් පැමිණෙන වෙනත් විෂයාන්තර දැනුම හා තොරතුරු සඳහා පරිවර්තන සාහිත්‍යයෙන් අවකාශයක් නොලැබුණු බව පෙනේ. මින් ප්‍රකට වනුයේ පුරාතන ලාංකේය දැනුම් හා තොරතුරු සමාජ ක්‍රමවේදය බොදු මුහුණුවර තුළම ගොනු ගතව පැවති බවයි.

මෙයට සමාන්තරව අපරදිග ලෝකය ආගමික සීමාවෙන් වියුක්තව නව දැනුම හා තොරතුරු සෙවීමට ගත් උත්සාහය ග්‍රීක දාර්ශනික යුගයේ පළ වූ ප්‍රලේඛන ආශ්‍රයෙන් තහවුරු කර ගත හැකි ය. මේ අනුව ක්‍රිස්තියානි ලෝකය ඇරිස්ටෝටල් ගැන දැනගනුයේ මුස්ලිම් දාර්ශනිකයෙකු වූ ඉබන් රුෂ්ධි (1126-98) ගෙනි. දාර්ශනික හා විද්‍යාත්මක තලයේ ඇරිස්ටෝටල්ට ලැබෙන අතිවිශාල ස්ථානය පළමුවෙන්ම තේරුම්ලත් පුද්ගලයා ඔහු ය. ක්‍රිස්තියානි ලෝකය ඇරිස්ටෝටල් ගැන දැනගනුයේ ඉහත කී මුස්ලිම් දාර්ශනිකයා ඇරිස්ටෝටල් ගැන ලියන ලද ලිපි ලතින් භාෂාවෙන් පළවීම නිසා ය (අයිවන් 2017). අපරදිග ලෝකයේ පුනරුදය සමග ග්‍රීක දාර්ශනිකයන්ගේ ලේඛන කියවීම, පරිවර්තනය, දැනුම හා තොරතුරු ව්‍යාප්තිය සුලභ

කාර්යයක් විය. ලෞකික ලෝකය පිළිබඳ දැනුම ව්‍යාප්තිය ඇරඹිණි. මේ අනුව මිසරයේ බිහි වූ ජ්‍යාමිතිය ප්‍රකට දාර්ශනිකයකු වන හේලිස් (ක්‍රි.පූ. 620-555) විසින් ග්‍රීසියට ගෙන ගියේ ය. ඉන්දියාවේ බිහි වූ **චෙස්** අරාබි ලෝකයටත් පසුව යුරෝපයෙත් ව්‍යාප්ත විය. මෙය සිදු වූයේ ජාතියක් සතු දැනුම හා තොරතුරු ලේඛන පරිවර්තනය හරහා තවත් ජාතියකට ගලා යාමෙනි. මෙයින් පැහැදිලි වනුයේ බටහිර ලෝකයට සාපේක්ෂව ඉපැරණි ලක්දිව ලේඛන සම්ප්‍රදාය බෞද්ධ චින්තනයටම සීමා වූ බවයි. ක්‍රිස්තු පූර්ව 3 සියවසේ සිංහල අටුවාකරණයත්, ක්‍රිස්තු පූර්ව 5 සියවසේ පාළි අටුවාකරණයත්, ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමක් ආශ්‍රිතව ඇරඹි දේශිය ලේඛන සම්ප්‍රදාය අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය දක්වා විකාශනය විමසන විට සනාථ වනුයේ, ආගමික සාහිත්‍යයෙන් බැහැරව පැමිණීමක් සිදු නොවූ බවයි. සාහිත්‍යමය හා විෂයාන්තරව යම් දැනුම් හා තොරතුරු ප්‍රමාණයක් ලේඛන සම්ප්‍රදායට පැමිණිය ද බුදු දහමේ බලපෑම ඒ තුළ ප්‍රකට ලක්ෂණයකි. බුදු දහම ආශ්‍රිතව ලියවුණු ටීකා, ටිප්පණි, අටුවා, සාහිත්‍ය නිර්මාණ සහ සමාන්තරව බිහි වූ ආයුර්වේද, ජොතිෂ්‍ය ආදි ප්‍රලේඛන සාහිත්‍යයෙන් හෙළි වනුයේ ඉපැරණි දැනුම් හා තොරතුරු සම්ප්‍රදාය බුදුදහම ප්‍රභව කොට අවිච්ඡින්නව පැවත ආ බවයි. විද්‍යාත්මක හා තාක්ෂණික වශයෙන් බාහිර ලෝකය අත්පත් කරගෙන තිබූ දැනුම හා තොරතුරු ලාංකේය සමාජය තුළට උරා නොගැනීමෙන් පැහැදිලි වනුයේ, බුදු දහම හා ලෞකික විෂය අතර වූ නොගැලපීමයි. ලෝකෝත්තර විෂයයක් ලෙස බුදුදහම විසින් ලෞකික විෂය ක්ෂේත්‍ර යටපත් කරනු ලැබූ බවයි.

යුරෝපීයයන් ලක්දිවට පැමිණ සාම්ප්‍රදායික ජනසමාජයේ සංචලන ඇති කරන තුරුම සම්ප්‍රදායික දැනුම් හා තොරතුරු සමාජයේ වෙනසක් සිදු නොවූ බව පැහැදිලි ය. අද දක්වාම නෂ්ටව පවතින බුදහම සහ බැඳුණ දැනුම් හා තොරතුරු වලින් ප්‍රකට වනුයේ, ලාංකේය සමාජ ස්ථරයෙහි ලා බුදු දහම කර තිබූ ප්‍රබල බලපෑමයි.

### ඉපැරණි දැනුම් හා තොරතුරු මධ්‍යස්ථාන සම්ප්‍රදාය

ශ්‍රී ලාංකේය ඉපැරණි දැනුම් හා තොරතුරු සමාජ සම්ප්‍රදායේ බෞද්ධ මුහුණුවර පැහැදිලි කෙරෙන සාධකයක් ලෙස **පොත්ගුල්** වශයෙන් නාමගත ඉපැරණි දැනුම් හා තොරතුරු මධ්‍යස්ථාන වැදගත් වේ. බොදු පසුබිමක් තුළ බිහි වූ ආගමික ලේඛන ආරක්ෂා කරගැනීමේ මධ්‍යස්ථාන වශයෙන් මෙම පොත්ගුල් බිහි වී ඇති බවට ඓතිහාසික සාක්ෂි වේ. බුදුදහම මෙරට ස්ථාපනය සමඟ ධර්මය පැහැදිලි කරදීම සඳහා සිංහල අට්ඨකථා සාහිත්‍යයක් මෙරට බිහිවිය. අට්ඨකථා එකළ ප්‍රථම පූජ්‍යස්ථාන වූ මහා විහාරය, ජේතවනය, අභයගිරිය ආදී විහාරස්ථාන වල තැන්පත් කරනු ලැබ ඇත. මහාවංශය අනුව තිස්සාරාමය, සූනනාථ, දීඝවංකමන, මාරුගණ, එලග්ග, දීඝානන්ද සෙන්පති, ග්‍රන්ථාකර යන විහාරස්ථාන ආශ්‍රිතව අනුරාධපුර

යුගයේ පුස්තකාල විය. පොලොන්නරු යුගයේ පූර්වාරාමය, දක්ෂිණාරාමය, උත්තරාරාමය, ජේතවනාරාමය, ලංකාතිලකය, තිවංකය ආදි ස්ථානවල පුස්තකාල පැවති ඇත.

ලාංකේය ඉතිහාස යුග පරිනාමය අනුව දඹදෙණි (13-14 සියවස) කෝට්ටේ ආදි යුග (15 සියවස) ආශ්‍රිතව පුස්තකාල පැවතිනි. බෞද්ධ ධර්මය සහ වෛද්‍ය විද්‍යාව, ජොතිෂ්‍යය, ආදි බාහිර විෂයගතව මේවායේ පොත් තැන්පත් කර තිබුණි. බොදු පසුබිමක් තුළ බිහි වූ මෙම පුස්තකාල ආශ්‍රිතව විද්‍යාත්මක හා තාක්ෂණික තලයේ පොත් බිහිවීමක් හෝ තැන්පත් කිරීමක් සිදු නොවුනු බව පෙනේ. මෙම තත්වය ලෝක පුස්තකාල ඉතිහාසය හා සන්සන්දනයේ දී පැහැදිලි වනුයේ, ලාංකේය පෞරාණික දැනුම් හා තොරතුරු මධ්‍යස්ථාන ආගමික මුලය තුළ බිහි වී යුරෝපීයයන් මෙරට පැමිණෙන තුරුම අවිච්ඡින්නව පැවත ආ බවයි. ලෝකයේ වෙනත් ශිෂ්ටාචාර ආශ්‍රිතව බිහි වූ පුස්තකාල මගින් පැහැදිලි වනුයේ, ඒවා ආගමික මූලයකින් බිහි වුව ද, ඉක්මනින්ම වෙනත් විෂය මූලගතව වර්ධනය වූ බවයි. ක්‍රිස්තු පූර්ව 7-6-5 ශත වර්ෂ වනවිට ඇසිරියානු, ඊජිප්තු, ග්‍රීක, රෝම ශිෂ්ඨාචාර ආශ්‍රිතව විවිධ විෂයගත පුස්තකාල පැවත ඇත. ක්‍රිසතු පූර්ව යුගයේ ග්‍රීසියේ බිහි වූ ඇරිස්ටෝටල්, ප්ලේටෝ, සොක්‍රටීස් ආදින්ගේ බටහිර විද්‍යා හා න්‍යාය ශාස්ත්‍ර ආශ්‍රිතව බිහි වූ පොත පත මේවායේ තැන්පත් කර තිබුණි. ක්‍රිස්තු පූර්ව 307 ඊජිප්තුවේ බිහි වූ **ඇලෙක්සැන්ඩ්‍රියානු පුස්තකාලය** මධ්‍යධරණි කලාපයේ විශේෂ පුස්තකාලයකි. ක්‍රිසතු පූර්ව 197-149 සුළු ආසියාවේ බිහි වූ **පර්ගමම් පුස්තකාලය** සහ ග්‍රීක හා රෝම යුගවල බිහි වූ පුස්තකාල මෙහි දී වැදගත් ය. ක්‍රිස්තු වර්ෂ 350 පමණ වන විට රෝමයේ මහජන පුස්තකාල 25කට නොඅඩුව පැවතිණි. රෝම යුගය බිඳ වැටී ක්‍රිස්තු වර්ෂ 622න් පසු ඇරබි මුස්ලිම් යුගය ලෝක පුස්තකාල ඉතිහාසයේ වැදගත් අවධියකි. මෙකල මහජන හා විශ්වවිද්‍යාල පුස්තකාල බිහිවිණි. විවිධ විෂය ගත පුස්තකාල බිහිවිණි. එය ආගම් මූල පුස්තකාල තත්වයෙන් අත් මිදීමකි. 14 ශත වර්ෂයේ සිවිල් යුධ තත්ව ඇතිවන තෙක් මුස්ලිම් ලෝකයේ පුස්තකාල වැදගත් විය. ක්‍රිස්තියානි අධිරාජ්‍ය ආක්‍රමණ සමඟ යුරෝපාකරයේ පුස්තකාල බිහිවීමේ විශේෂ තත්ව ඇතිවිය. ආගමික පසුබිමක් තුළ එංගලන්තය, ඉතාලිය, ස්පාඤ්ඤය, ජර්මනිය ආදි රටවල ඇරඹී අරාබි පුස්තකාල වේගයෙන් වෙනස් විෂය ගත පුස්තකාල බවට පත්විය. බටහිර ලෝකයේ විශ්වවිද්‍යාල පුස්තකාල ආශ්‍රිතව දියුණු පුස්තකාල සංස්කෘතියක් ඇති විය. ක්‍රිස්තු වර්ෂ 11-12 සියවස් වන විට යුරෝපයේ බොහෝ ස්ථානවල පුස්තකාල බිහි විය. පුනරුද යුගයේ පෞද්ගලික පුස්තකාල බිහි විය. මෙකල බටහිර ලෝකයේ ෆැන්සිස් බේකන් (1561-1620), හොබ්ස් (1588-1679), ඩේකාට් (1596-1650), ජෝන්ලොක් (1632-1704), ඩේවිට් හියුම් (1712-1778), කාන්ට් (1724-1804) ආදි විද්වතුන් විවිධ විෂයගත පොත්පත් බිහි කරනු ලැබ ඇත.

මෙම අවධිය වනවිට ලක්දිව ප්‍රකට විද්වතුන් වූයේ වීදාගම මෛත්‍රිය හිමි, තොටගමුවේ ශ්‍රී රාහුල හිමි, වනරතන හිමි, වෑත්තෑවේ හිමි ආදීන් ය. මෙම යතිවරුන්ගෙන් බිහිව තිබුනේ බුදුගුණාලංකාරය, ලෝවැඩ සඟරාව, කව්ලකුණු මිණි මල, එළු අත්තනගළු වංශය, ගුත්තිල කාව්‍ය හා සංදේශ ගණයේ කෘතින් වේ. මින් ප්‍රකට වනුයේ ලක්දිව ඉපැරණි දැනුම් හා තොරතුරු සම්ප්‍රදාය පවත්වාගෙන යාමට මූලික වූ පැරණි දැනුම් හා තොරතුරු මධ්‍යස්ථාන ආගමික ලේඛන අඩංගු බෞද්ධ පුස්තකාල වශයෙන් අවිච්ඡින්නව පැවත ආ බවයි. යුරෝපීයයන් මෙරට ආගමනය වන තුරුම බෞද්ධ සංස්කෘතික මූලයෙන් නොවනස්ව මෙරට දැනුම් හා තොරතුරු සම්ප්‍රදාය පැවත ආ බවයි.

**සමාලෝචනය**

ශ්‍රී ලංකාවේ ඉපැරණි දැනුම් හා තොරතුරු සමාජ සම්ප්‍රදාය එකළ පැවති සමාජ, ආර්ථික, සංස්කෘතික, ආගමික පරිසරයට සාපේක්ෂව බිහිවූවකි. බුදු දහමට සංකල්පිතව වැඩුන එය ව්‍යවහාරමය වශයෙන් ද බෞද්ධ සංස්කෘතික නිර්මාණයකි. එනම් එය තත් කාලීන චින්තනය හා බැඳුණු ඓතිහාසික නිමවුමකි. ක්‍රිස්තු පූර්ව 3 ශත වර්ෂයේ සිට අනුරාධපුර යුගය පදනම් කරගනිමින් බිහි වූ එම දැනුම් හා තොරතුරු සමාජ සම්ප්‍රදාය 15 ශත වර්ෂයේ පෘතුග්‍රීසින් මෙරටට ආගමනය වන තුරුම අඛණ්ඩ ව ප්‍රගමනය වූවකි. ලෞකික විෂයමය වශයෙන් යම් යම් විපරිනාමයන්ට ලක් වුව ද, බුදු දහමේ ආකර්ශනයෙන් මුළුමනින් ම මිදීමට එයට නොහැකි විය. බාහිර ලෝකයේ දැනුම් හා තොරතුරු සමාජ පරිසරයේ කිසිදු සංචලනයකට යටපත් නොවී නිර්මල බෞද්ධ සංස්කෘතික පදනමක් මත එය හැදී වැඩුනි. මහින්දාගමනය සමඟ බුදු දහම මෙරට මුල් බැස ගැනීම ආගමක් බිහි වීමකට පමණක් සීමා නොවී, ජීවන ක්‍රමයක් සංස්කෘතියක් බිහිවීම දක්වා ප්‍රගමනය වීම ඊට හේතු සාධක වූවා නිසැක ය. මේ අනුව බෞද්ධ සංස්කෘතික මූලයන් මත පදනම්ව ලක්දිව දැනුම් හා තොරතුරු සමාජ සම්ප්‍රදාය බෞද්ධ මුහුණුවරකින් සමාජගතව ඇත. ලක්දිව චිරන්තන දැනුම් හා තොරතුරු සම්ප්‍රදාය බෞද්ධ තොරතුරු හා දැනුම් සමුදායක් ලෙසත්, ගුරුකුල අධ්‍යාපනය මත බෞද්ධ අධ්‍යාපන ක්‍රමවේදය ආශ්‍රිතවත් සමාජ ගතව ඇත. එම බෞද්ධ තොරතුරු හා දැනුම් සම්ප්‍රදායේ ලිඛිත ප්‍රකාශන මාධ්‍ය ලෙස බෞද්ධ ප්‍රලේඛන සාහිත්‍යයකුත්, එම බෞද්ධ ප්‍රලේඛන ආරක්ෂා කිරීමේ පදනමින් ඓතිහාසික බෞද්ධ තොරතුරු හා දැනුම් මධ්‍යස්ථාන සම්ප්‍රදායකුත් බිහි වී ඇත. ලංකාවේ චිරන්තන තොරතුරු හා දැනුම් සමාජ සම්ප්‍රදාය බෞද්ධ දැනුම් හා තොරතුරු සමුදාය, බෞද්ධ අධ්‍යාපන ක්‍රමවේදය, බෞද්ධ ප්‍රලේඛනවේදය, බෞද්ධ තොරතුරු හා දැනුම් මධ්‍යස්ථාන ක්‍රමවේදය හා අවියෝජනීයව බැඳෙමින්, අස්පර්ශනීය බෞද්ධ සංස්කෘතික උරුමයක් ලෙස ප්‍රගමනය වී ඇති බව පැහැදිලි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ හා ලේඛන නාමාවලිය


අයිවන්, වික්ටර් (2017) *චින්තනයේ දුප්පත්කමේ ඓතිහාසික වටපිටාව*, රාවය, බොරලැස්ගමුව.

කුලසූරිය, ආනන්ද (1999) *සිංහල සාහිත්‍ය*, විසිදුනු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව.

*චීන තෙරුන්ගේ ගමන් විස්තරය හා හියුං සාං භ්‍රමණ වෘත්තාන්තය* (1961) අනු. පොල්වත්තේ බුද්ධවංශ හිමි, ආනන්ද පොත් සමාගම, අම්බලන්ගොඩ.

ජයවීර, එ.එම්.එච්. (1996) *ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමය*, ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, කොළඹ.

ධර්මකීර්ති හිමි, නිවන්දම (2009) *ශ්‍රී ලංකාවේ 2500 ක වසරක සංක්ෂිප්ත ශාසන ඉතිහාසය*, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

පල්ලියගුරු, චන්ද්‍රසිරි (2003) *සංස්කෘතිය සමාජය හා පෞරුෂය*, ගොඩගේ, කොළඹ.

පෙරේරා, ඉන්ද්‍රානී (2006) *කළමනාකරණ සංකල්ප : බෞද්ධ ප්‍රවේශයක්*, කර්තෘ ප්‍රකාශන. බොරලැස්ගමුව.

බස්නායක, එච්.ටී. (2003) *අපරදිග ශිෂ්ටාචාරය*, ගොඩගේ, කොළඹ.

*මහාවංශය* (1976) අනු. ශ්‍රී සුමංගල හිමි හා බටුවන්තුඩාවේ දේවරක්ඛිත, ගොඩගේ, කොළඹ.

රණසිංහ, ආර්.එම්.අයි.එස්. (2006) *පැරණි ශ්‍රී ලංකාවේ පුස්තකාල සම්ප්‍රදාය*, කර්තෘ ප්‍රකාශන, කැලණිය.

*ලංකාවේ අධ්‍යාපනය, සියවස* (1995) අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යංශය, කොළඹ.

ලියනගමගේ, අමරදාස හා රණවීර ගුණවර්ධන (1961) සංස්. *අනුරාධපුර යුගය*, 4 සංස්කරණය, චතුර, වැල්ලම්විටිය.

විමලවංශ හිමි, බද්දේගම (2000) *අපේ සංස්කෘතිය*, සමයවර්ධන. කොළඹ.

වීරසිංහ, ටියුඩර් (2003) *ගෝලීය සමාජය හා එහි මතවාදය*, ගොඩගේ. කොළඹ.

වීරසිංහ, ඩබ්.කේ.එම්.කේ. (2006) *පුස්තකාල ඉතිහාසය පුස්තකාල ආරම්භයේ සිට නූතන යුගය දක්වා සංක්ෂිප්ත විවරණයකි,* කර්තෘ , දළුගම.

සන්නස්ගල, පුඤ්චි බණ්ඩාර (1961) *සිංහල සාහිත්‍ය වංශය : ආරම්භයේ සිට 1994 දක්වා* ගොඩගේ, කොළඹ.

*සිංහල ගද්‍ය සාහිත්‍ය* (2014) සංස්. පේමදාස ශ්‍රී අලවත්තගේ, ගොඩගේ. කොළඹ.

සෝරත හිමි, වැලිවිටියේ (1970) *ශ්‍රී සුමංගල ශබ්දකෝෂය*, කොළඹ.

http://www.mathsisfun.com/data/data/data.html